# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2061/22 - 2018 මාර්තු මස 07 වැනි බදාදා - 2018.03.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වැඩබලන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 මාර්තු මස 08 වැනි දින සිට ආරම්භ වන මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

ඉරාන් වික්‍රමරත්න,
වැඩබලන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 මාර්තු මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1. | 03.03 | 0303.54 | මැකරල් (ස්කොම්බර් ස්කොම්බුස්, ස්කොම්බර් ඔස්ට්‍රාලසිකස්, ස්කොම්බර් ජැපොනිකස්) | කි. ග්‍රෑමයට රු. 6.00 |
| 2. | 07.13 | 0713.10.10 | සම්පූර්ණ - මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 15.00 |
| | | 0713.10.20 | පියලි කළ - මෑ වර්ගයේ ඇට (පීසම් සැටයිවම්) | කි. ග්‍රෑමයට රු. 18.00 |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 3. | | 0713.20.10 | සම්පූර්ණ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි. ග්‍රෑමයට රු. 7.00 |
| | | 0713.20.20 | පියලි කළ - කොණ්ඩ කඩල (ගාර්බන්සෝස්) | කි. ග්‍රෑමයට රු. 10.00 |
| 4. | | 0713.35.90 | අනෙකුත් - කව්පි | කි. ග්‍රෑමයට රු. 70.00 |
| 5. | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.21.90 | බීජ - අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.90 | අනෙකුත් - (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |

03 - 923

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.